# ආරක්ෂක අමාත්‍යාංශය

# ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය

# ඇබෑර්තු

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ පහත සඳහන් තනතුරු සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන් වෙතින් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

## ජ්‍යෙෂ්ඨ විද්‍යාඥ (ඉංජිනේරු) AR -2 (සිවිල් හා ව්‍යුහික) (තනතුරු - 01)

**බාහිර :**

**සුදුසුකම් :** (පහත 1 හෝ 2)

(1) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තනතුරට අදාළ සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ වසර හතරක විශේෂ ප්‍රථම උපාධිය

**හා**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන සිවිල් හා ව්‍යුහික ඉංජිනේරු විද්‍යාව පිළිබඳ පශ්චාත් (මාස්ටර්ස්) උපාධිය හෝ ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනයේ (IESL) ආයතනික සාමාජිකත්වය (වරලත් ඉංජිනේරු)

**සමග**

ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසුව රජයේ සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක සිවිල් හා ව්‍යුහික ඉංජිනේරු ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර අටක (8) පළපුරුද්ද

(2) ශ්‍රී ලංකාවේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන තනතුරුට අදාළ සිවිල් ඉංජිනේරු විද්‍යාව පිළිබඳ වසර හතරක විශේෂ ප්‍රථම උපාධිය

**සහ**

ඉංජිනේරු ක්ෂේත්‍රයේ ආචාර්ය උපාධියක්

**සමග**

ප්‍රථම උපාධිය ලබාගැනීමෙන් පසුව රජයේ සංස්ථාවක, මණ්ඩලයක, ව්‍යවස්ථාපිත ආයතනයක හෝ පිළිගත් පුද්ගලික ආයතනයක සිවිල් හා ව්‍යුහික ඉංජිනේරු ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක (05) පළපුරුද්ද

**සටහන** : අදාළ ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ ප්‍රකාශන අමතර සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.

## කළමනාකරු - රසායනාගාර/ තාක්ෂණික MM 1-1-II වන ශ්‍රේණිය (තනතුරු 04යි)

**බාහිර** : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ලබාගත් ඉංජිනේරු විද්‍යාව/ විද්‍යාව/තාක්ෂණවේදය පිළිබඳ ප්‍රථම උපාධිය

**හෝ**

ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව (NDT) හෝ NVQ-6 ට නොඅඩු ජාතික වෘත්තීය සුදුසුකම් සමග රජයේ දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/ මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක තාක්ෂණ / කාර්මික නිලධාරි ලෙස වසර අටක (8) සේවාව

රසායනාගාර විශ්ලේෂණ කටයුතු හෝ තත්ත්ව පාලන පද්ධති ආශ්‍රිත ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර තුනක පශ්චාත් සුදුසුකම් පළපුරුද්දක් සේවා පළපුරුද්ද ලෙස ලබා තිබීම

## කණිෂ්ඨ කළමනාකරු - හිල් විදින නිලධාරි JM 1-1, II වන ශ්‍රේණිය (තනතුරු 01)

**බාහිර** : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයකින් ලබාගත් භූවිද්‍යාව විෂයක් ලෙස වසර තුනක ප්‍රථම උපාධියක් (භූතාකර්ෂණ ක්ෂේත්‍ර විමර්ශන හා භූ භෞතික විද්‍යා පළපුරුද්ද වැඩි වාසියක් වනු ඇත)

**හෝ**

තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් 7 වන මට්ටමට නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම.

**හෝ**

ජාතික තාක්ෂණ ඩිප්ලෝමාව හෝ NVQ 6 ට නොඅඩු සමාන සුදුසුකමක් සමත් වී තිබීම සමග අදාළ ක්ෂේත්‍රයේ රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක/ මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක භූතාකර්ෂණ ක්ෂේත්‍රයේ විමර්ශන සහ භූ භෞතික ක්ෂේත්‍රයේ වසර පහක (05) පළපුරුද්දක් ලබා තිබීම

**හෝ**

ජාතික තාක්ෂණ සහතිකය හෝ NVQ 5 ට නොඅඩු සුදුසුකමක් ලබා තිබීම සමග අදාළ ක්ෂේත්‍රයේ රජයේ දෙපාර්තමේන්තුවක/ සංස්ථාවක/ මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක භූතාකර්ෂණ ක්ෂේත්‍ර විමර්ශන හා භූ භෞතික පිළිබඳ වසර දහයක (10) පළපුරුද්ද ලබා තිබීම

## කළමනාකරණ සහකාර - තාක්ෂණික කාණ්ඩලය (විදුලි) MA 2-2 - III වන ශ්‍රේණිය (තනතුරු -06ක්)

**බාහිර** : තෘතීය හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකම් මට්ටම් 5ට නොඅඩු නිපුණතා සහතිකයක් ලබා තිබීම හෝ රජයේ කාර්මික විද්‍යාල වෙතින් ජාතික තාක්ෂණ සහතිකය හෝ සමාන සුදුසුකමක් ලබා තිබීම.

**හෝ**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයක්/ ආයතනයක් වෙතින් රසායනාගාර ඩිප්ලෝමාවක් ලබා තිබීම.

## කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන කාණ්ඩය - MA 1-2 - III වන ශ්‍රේණිය (තනතුරු -06ක්)

**බාහිර :** (අ) i සිංහල/ දෙමළ/ ඉංග්‍රීසි

ii ගණිතය

ඇතුළුව විෂයන් හතරක් සඳහා සම්මාන සහිතව එකවර විෂයන් හයකින් අ.පො.ස (සා/පෙළ) විභාගය සමත්වී තිබීම

(ආ) අ.පො.ස (උ/පෙළ) විභාගයේ විෂයන් තුනක් සමත්වී තිබීම.

බඳවාගැනීමේ පරිපාටිය : ලිඛිත තරග විභාගයක් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණය මගින්

**පොදු කොන්දේසි** :

වැටුප් පරිමාණය : AR-2, රු.133,220-10X3660-169,220/-

මූලික වැටුප් පිවර : රු. 100,306/- (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛන ii පරිදි)

වැටුප් පරිමාණය : MM 1-1-ii වන ශ්‍රේණිය- රු. 91,690-10X2480-15X3450-168,240/-

මූලික වැටුප් පියවර : රු. 71,730/- (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛන ii පරිදි)

වැටුප් පරිමාණය : JM 1-1-ii වන ශ්‍රේණිය - රු. 72,650-10X1360-18X2040-122,970/-

මූලික වැටුප් පියවර : රු. 58,615/- (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛන ii පරිදි)

වැටුප් පරිමාණය : MA 2-2-iii වන ශ්‍රේණිය - රු. 50,540-10X540-7X630-4X1080-20X1280-90,270/-

මූලික වැටුප් පියවර : රු. 43,379/- (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛන ii පරිදි)

වැටුප් පරිමාණය : MA 1-2-iii ශ්‍රේණිය - රු. 46,220-10X540-7X630-12X1080-12X1280-84,350/-

මූලික වැටුප් පියවර : රු. 40,403/- (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 හි උපලේඛන ii පරිදි)

**වයස් සීමාව :**

AR-2 - අවුරුදු 30ට නොඅඩු හා අවුරුදු 55ට නොවැඩි

MM 1-1- ii වන ශ්‍රේණිය & JM 1-1-ii වන ශ්‍රේණිය- අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 55ට නොවැඩි

MA 2-2 -iii ශ්‍රේණිය සහ MA 1-2 -iii වන ශ්‍රේණිය - අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි අභ්‍යන්තර අයදුම්කරුවන්ගෙන් අභ්‍යන්තර සුදුසුකම් පරිදි අයදුම්පත් කැඳවනු ලැබේ. අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**අනෙකුත් ප්‍රතිලාභ :**

- ✷ ජීවන වියදම් දීමනාව
- ✷ ආයතනය විසින් සේ.අ.අ. සඳහා 12% සහ සේ.භා.අ. සඳහා 3% ක දායකත්වය සඳහා හිමිකම
- ✷ වෛද්‍ය නිවාඩු වෙනුවෙන් මුදල් ගෙවීම සහ රජයේ චක්‍රලේඛ පරිදි වාර්ෂික පාරිතෝෂිතය
- ✷ මාසික කාර්යසාධන දිරිදීමනාව
- ✷ ජීවිත රක්ෂණ ආවරණය හා වෛද්‍ය රක්ෂණ ආවරණය
- ✷ සන්නිවේදන දීමනාව (යෝග්‍යතාවය සහිත තනතුරු සඳහා පමණයි)
- ✷ රජය විසින් අනුමත කරන ලද අනෙකුත් ප්‍රතිලාභ

රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත ආයතනවල සේවකයන්ගේ අයදුම්පත් ඔවුන්ගේ අදාළ ආයතන ප්‍රධානීන් මගින් යොමු කළ යුතුය. සම්පූර්ණ ජීව දත්ත සහිත අයදුම්පත් අදාළ සහතිකවල පිටපත් සමග 2025 ජූලි 30 වෙනි දින හෝ ඊට පෙර පහත අත්සන් කළ අයට ලැබෙන පරිදි ලියාපදිංචි තැපැල් මගින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවරේ අයදුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

**අධ්‍යක්ෂ ජනරාල්,**
**ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය,**
**99/1, ජාවත්ත පාර, කොළඹ 05.**

tamilguru.lk